හමුදා ජයග්‍රහණයන් පිළිබඳව තවදුරටත් ලිවීමේ අවශ්‍යතාවක් නැත. මාවිල්ආරු මුදා ගැනීමේ මෙහෙයුමේ සිට අද වන තුරුත් සිදුවන්නේ එයයි. එල්.ටී.ටී.ඊ.ය දිගින් දිගටම දකුණේ සිවිල් වැසියන් ඝාතනය කරද්දීත්, බඩු මිල කප්පරකට ඉහළ යද්දී ජනතාව ඉවසා සිටින්නේ ඒ ජයග්‍රහණයන් නිසයි. ත්‍රස්තවාදය මුලිනුපුටා දැමිය නොහැකි බව සපථ කළ අයගේ කටවල් වැසෙන්නේ එවැනි මොහොතකය. එහෙත් ත්‍රස්තවාදය මුලිනුපුටා දැමූ පමණින් ත්‍රස්තවාදී අරමුණු වටා බලමුළු ගැන්වුණු පිරිසගේ වුවමනාව අවසන් වන්නේ නැත. එය වෙනත් වෙනත් ස්වරූපයන්ගෙන් යළි මතුව එම නිසැකය.

එයට කැස කවන විජාතික බලවේගයන් හා එක්ව නව මාදිලියේ මොඩලයක් තනන්නට දැනටමත් සැලසුම් කරන පිරිස් අපමණය. එහෙත් රටට නිවැරැදි නායකත්වයක් සපයන වැඩි දෙනෙකු පරදවා, කොටි ත්‍රස්තවාදය මේ වසරේ නිමා කිරීමේ ඉලක්කය පරදවා එකී ජාති ද්‍රෝහී බලවේගයන්ට උඩගෙඩි දෙන යෝජනාවලියක් සැකසීමේ කුමන්ත්‍රණය වසරකට පමණ පසු එළිදැක්වීමේ නාටකය පසුගියදා නිමාවූයේ 13 වැනි සංශෝධනයට නව පණක් ලබා දෙමිනි.

රජය සර්වපාක්ෂික සමුළුව කැඳවූයේ සිය නිවැරැදි පරමාර්ථයන් ඉටු කර ගැනීම පිණිස වුවද, එහි කිහිප දෙනෙකු එකතුව එකී විජාතික බලවේග ජයග්‍රහණය කිරීම පිණිස පෙළ ගැසී සිටියි.

ඒ අනුව සති ගණනාවකට පසු එකී යෝජනාවලිය ඉදිරිපත් කෙරුණේ 13 වැනි සංශෝධනයට නව පණක් ලබා දෙමිනි.

1987 ජූලි 27 වැනි දින ජේ. ආර්. ජයවර්ධන හා ඉන්දීය අගමැති රජීව් ගාන්ධිගේ ඉන්දු - ලංකා ගිවිසුමේ දෙවැනි වගන්තිය යටතේ නිර්දේශිත පළාත් සභා 1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය 1987 අංක 42 දරන පළාත් සභා පනත තුළින් උපත ලැබීය. එමගින් සිදුවූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි වගන්තිය සංශෝධනය කිරීමයි. මේ මගින් සිංහල මෙන්ම දෙමළ රාජ්‍ය භාෂා වශයෙන් සම්මත විය.

(௦ඪ෴ අ- වශයෙන් අලුත්ම පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වූයේ එමගිනි. එයින් පළාත් සභා ක්‍රමය ඇති කරන ලදී. එහිදී අලුතින් එක් කරනු ලැබූ වගන්ති වලින් පළාත් සභාවට මන්ත්‍රීන් තෝරා ගැනීම, ඔවුන්ගේ ධුර කාලය, එහි බලතල, කර්තව්‍ය, පළාත් සභා ක්‍රියාත්මක විය යුතු ආකාරය, නීති සම්පාදනය හා නීති ක්‍රියාත්මක කිරීම ආදී කරුණු සවිස්තරාත්මකව දක්වා ඇත. පොදු කරුණු පිළිබඳව සමගාමී විෂය ලැයිස්තුවක් දක්වා ඇත. පළාත් සභාවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමට හා මුදල් පරිපාලනය සඳහා මුදල් කොමිෂන් සභාවක් මේ මගින් ප්‍රතිෂ්ඨාපනය කෙරේ. පිහිටුවනු ලබන පළාත් සභා හා ඒවායේ කර්තව්‍ය හා බලතල 8 හා 9 වැනි උප ලේඛනවල දක්වා ඇත. ඒ සමගම සංවෘත ලැයිස්තුව හා සමගාමී ලැයිස්තුව ද අවශ්‍ය උප ලේඛනයට ඇතුළත් කර ඇත. එම ලැයිස්තුවලින් රේඛීය හා පළාත් ආණ්ඩුවල බලතල හා කාර්යයන් පැහැදිලි වේ. 9 වැනි උප ලේඛනයට අනුව පළාත් සභාවට පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා බලතල පවරා ඇත.

1. පොලිසිය හා මහජන සාමය

2. පළාත් සභාවලට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම.

3. අධ්‍යාපනය හා අධ්‍යාපන සේවා

4. පළාත් පාලනය

5. නිවාස හා ඉදිකිරීම් කටයුතු

6. සමාජ සේවා හා පුනරුත්ථාපන කටයුතු

7. ගමනාගමනය

8. කෘෂිකර්මය හා ගොවිජන සේවා

9. සෞඛ්‍යය

10. ඉඩම්

11. මුදල්

12. සමුපකාර

13. ආහාර

එහෙත් එජාප ආණ්ඩුව යටතේ වර්ධරාජා පෙරුමාල් මහ ඇමැතිවරයකු හැටියට කටයුතු කළා විනා ඒ වගන්ති හරි හැටි ක්‍රියාත්මක කෙරුණේ නැත.

ජේ. ආර්. ජයවර්ධන ඒ මොහොත වනවිට සිටියේ සාමය ගැන සිහින දකිමිනි. රජීව් ගාන්ධි ඡේප් න්‍යායට බර කර ගැනීමට එල්.ටී.ටී.ඊ.යට හැකි විණ. එල්.ටී.ටී.ඊ. නායකයා ඒ වකවානුවේ පළාත් සභා ක්‍රමය පිළිගන්නට සූදානමින් සිටියේ ඉහත 9 වැනි වගන්තිය යටතේ සිද්ධ කෙරුණු බලය ලබා ගැනීමේ ක්‍රියාදාමය සාර්ථක වූ හෙයිනි. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය තුනෙන් දෙකක බලයෙන් සම්මත කළ ද තීන්දුව ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙකට බෙදිණි. ජාතිකත්වය හා ඒකීය භාවය වෙනුවෙන් පෙනී සිටි විනිසුරුවරු එය ප්‍රතික්ෂේප කරන මතයක සිටියේය. එය යන්තම් එහෙන් මෙහෙන් අටවා නාමිකව පළාත් සභා වශයෙන් ලබා දුන් ෆෙඩරල් ක්‍රමයක් බවට පත් වූයේ එලෙසිනි.

එතැන් සිට එල්.ටී.ටී.ඊ.ය ක්‍රියාත්මක වූ ආකාරය ගැන යළි යළිත් සිහිපත් කිරීම අනවශ්‍යය. එය බෝම්බ, මිනිස් ඝාතන ලේ හා කඳුළු ගැන පමණක් ලියැවෙන්නකි. ඒ අතර පාවාදීම් හා බලලෝභී දේශපාලනය කපටිකම් වලින් ද අනූන වූවකි.

ඉදින් මේ සා අලකලංචියක් සිදුකළ පළාත් සභාවේ 13 වැනි ව්‍යවස්ථා මුහුණුවර ගෙන එන්නේ පළාත් සභාවලට මෙතෙක් ලබා නොදුන් බලතල ද සමගිනි. ඒ අනුව පළාත් සභාවලට හිමිවී ඇති ඉඩම් හා පොලිස් බලතල ද වෙයි. ඒ අනුව 9 වැනි වගන්තිය යටතේ මෙතෙක් ලබා නොදුන් විශේෂ බලතල පළාත් සභාවලට හිමිවීම සිදුවේ.

ඉතා විශේෂිතව තේරුම් ගත යුතු, අවධානය යොමු කළ යුතු කාරණය වන්නේ එය නොවේ. ඉහත ගෙන හැර දැක්වූ ලැයිස්තුවට අයත් විෂයයන්ට අදාළව මධ්‍යම ආණ්ඩුවට යම් බලයක් ලබා දී ඇති මුත් සැලකිය යුතු බලයක් පළාත් සභාවට හිමිකර දීම කෙරෙහි ය. මධ්‍යම ආණ්ඩුව යටතේ ආරක්ෂාව පිළිබඳව පූර්ණ වගකීමක් පවතින මොහොතක පවා ජාතිවාදී, බෙදුම්වාදී ඉලක්ක වෙනුවෙන් ප්‍රචණ්ඩත්වය වපුරන පිරිස් අතට මෙවැනි බලතල හිමිවුවහොත් සිදුවන විනාශය පිළිබඳවය.

තවමත් හමුදාව ගෙන යන සටනේ ජයග්‍රහණය කරා යන ගමනේ අවසානය කරා පැමිණ නැත. එහෙත් එය ඉතාම නොදුරෙනි. එසේ තිබියදීත් මෙවැනි හදිසි බලය බෙදීමක අවශ්‍යතාව මතුවන්නේ, කොටි වෙනුවෙන් ම පෙනී සිටින පිරිසකට පමණක් බව ඉඳුරාම කිව යුතුය. එල්.ටී.ටී.ඊයට ඉතාම ප්‍රවේශමෙන් අනතුරක් සිදු නොකොට බෙදුම්වාදයට යා හැකි මාවත නිරාවරණය කරනු මිසක එහි වෙනත් අවශ්‍යතාවක් පෙනෙන්නට නැත. එහි සරල අර්ථය ත්‍රස්තවාදය අවසාන වශයෙන් පරාජය නොකර, උතුර - නැගෙනහිර ජනමතය නොවිමසා ගෙන එන ඊනියා විසඳුමක් යනු ජයග්‍රහණය ආපස්සට හැරවීමක් යන්නය.

අවම වශයෙන් මෙම යෝජනාවලිය ජනමතය හෝ විමසා බැලීමකින් තොරව ඉදිරිපත් කරන ලද්දකි. එම යෝජනාවලියට අනුව පූර්ණ බලතල සහිතව පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ නිර්දේශය අඩංගු ඉන්දු ලංකා ගිවිසුම බාහිරින් මෙරට ජනතාවට ඉදිරිපත් කරනු ලැබුවක් මිස නිවැරදි එකක් නොවන බව අවධාරණය කළ යුතුය.

සර්ව පාක්ෂික නියෝජිත සමුළුව නියෝජනය කළ මහින්ද චින්තනයේ පෙරටුගාමීන් වූ ජවිපෙ මුලදීම අනතුර හඳුනාගත්තේය. ඔවුන් අදටත් ඉන්දු - ලංකා ගිවිසුම ආරම්භයේදී සිටි ස්ථාවරයේම සිටින්නේය.

කොළේ වසා ගැහිල්ලේ රඟ පිළිබඳව අධ්‍යයනය කරන්නට නොහැකි වූ ජාතිමාමක බලවේගයන් එයට එකඟත්වය පළ කිරීම දේශපාලනයේ කුහක බව ප්‍රදර්ශනය කිරීමක් වැනිය.

එජාපය මුල සිටම සිටියේ මේ භූමිකාව තුළ බැවින් එය එතරම් ම සැලකිය යුතු නොවේ. එහෙත් එ.ජා.ප ප්‍රජාතන්ත්‍රවාදී පිල කටයුතු කරන ආකාරය ප්‍රශ්නකාරීය.'

මහින්ද චින්තනය හොඳය. එය රට දිනවන්නේය. එබැවින් අපි මහින්ද චින්තනය දිනවීම පිණිස රජයට එක්වූයෙමු යි කී මේ පිල හිටි හැටියේ පීල්ල මාරු කරන අන්දමක් පෙනෙන්නට ඇත. ප්‍රජාතන්ත්‍රවාදී පිලේ වැඩි දෙනෙක් සිටියේ ෆෙඩරල් විකාරයෙන් වුවද, රජයට එකු වීමේ දී කළ කී දේ හා අද පවසන දේ අතර ඇත්තේ විශාල පරස්පරයකි.

කල් පවත්නා සාමයකට අන්තර් පාලනය අත්‍යවශ්‍ය සාධකයක් යැයි එදා කියූ ෆෙඩරල් පැණි මුට්ටියේ ම සිටි සමහර මහාචාර්ය ඇමැතිවරු ද මේ මොහොතේ 13 වැනි සංශෝධනයට පණ එම පිළිබඳව සතුටු වනවා නිසැකය. මේ අර්බුදය ආරම්භයේ සිටම ඉක්මන් කොටයි විසඳුම් වලට ගිය කිසි විටෙකත් ඉන් යහපත් ප්‍රතිඵල අත්වූයේ නැත. ඉන්දු - ලංකා ගිවිසුම ගෙන ආ ජේ. ආර්. ට මෙන්ම පැකේජය ගෙන ආ චන්ද්‍රිකාට සිදු වූ අකරතැබ්බයන් සිහිපත් කර ගැනීම හොඳය. කොටින් විසින්ම ඊළම ලබා ගනු පිණිස ඉදිරිපත් කළ අන්තර් පාලන ලියැවිල්ල හොඳ යැයි කිවු පක්ෂ අද නාය යනවා යැයි කියන්නේ නිකමට නොවේ. බලතල බෙදා දෙන්නට ගොස් ඉල්ලං කෑ රජීව් ගාන්ධි ට සිදු වූ දේ පවා හොඳම වර්ගයේ නිදසුන්ය.

දීර්ඝ අටුවා ටීකා අවශ්‍ය නැත. තවමත් යුද්ධය අහවර නැත. එය ජයග්‍රහණය කළ හැකිය. ජයග්‍රහණයෙන් පසුව උතුරු නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළ යුතුය. ජනමතය විමසිය යුත්තේ ඉන් පසුය. ඊට පසු ෆෙඩරල් හෝ බලය බෙදීමක් අවශ්‍ය නොවන බව විශ්වාසය. ඉවසන්න!!!

**උදේශ සංජීව ගමගේ**